Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- :- ගණිතය

සතිය- 9 (1 වාරය)

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය:- 8

(ඉගෙනුම් කාලය :- පැය 3 )

# 06. ඝන වස්තු

- අවකාශයේ යම් ඉඩක් ගන්නා නියත හැඩයක් ඇති වස්තු, ඝන වස්තු ලෙස හැඳින්වේ.
- ඝන වස්තුවල මතුපිට, තල පෘෂ්ඨ කොටස්වලින් හෝ වක්‍ර පෘෂ්ඨ කොටස්වලින් හෝ සමන්විත වේ.
- 7 ශ්‍රේණියේදී ඔබ ඉගෙන ගත් ඝන වස්තු පාඩම සිහිපත් කර ගන්න. බ්‍රිස්ටල් බෝඩ් භාවිත කරමින් ඝනකය, ඝනකාභය, සවිධි චතුස්තලය, සමචතුරස්‍ර පිරමීඩය, ත්‍රිකෝණ ප්‍රිස්මය යන ඝන වස්තු වල ආකෘති නිර් මාණය කරන්න.
- එම ආකෘතිද ආධාර කර ගනිමින් පුනරීක්ෂණ අභ්‍යාසය කරන්න.

6.2 සවිධි අෂ්ටතලය


- එක සමාන සමපාද ත්‍රිකෝණාකාර මුහුණත් අටකින් සෑදී ඇති ඝන වස්තුවක් සවිධි අෂ්ටතලයක් ලෙස හැඳින්වේ. 70,71 පිටුවල ඇති ක්‍රියාකාරකම 1 කරමින් සවිධි අෂ්ටතලයක ආකෘතියක් නිර් මාණය කර එහි ලක්ෂණ හඳුනාගෙන සටහන් කරන්න.

6.3 සවිධි ද්වාදසතලය

- සවිධි පංචාස්‍රාකාර මුහුණත් දොළහකින් සෑදී ඇති ඝන වස්තුවක් සවිධි ද්වාදසතලයක් ලෙස හැඳින්වේ. 72,73 පිටුවල ඇති ක්‍රියාකාරකම 2 කරමින් සවිධි ද්වාදසතලයක ආකෘතියක් නිර් මාණය කර එහි ලක්ෂණ හඳුනාගෙන සටහන් කරන්න.

6.4 සවිධි විංසතිතලය

- එක සමාන සමපාද ත්‍රිකෝණාකාර මුහුණත් විස්සකින් සෑදී ඇති ඝන වස්තුවක් සවිධි විංසතිතලයක් ලෙස හැඳින්වේ. 74,75 පිටුවල ඇති ක්‍රියාකාරකම 3 කරමින් සවිධි විංසතිතලයක ආකෘතියක් නිර් මාණය කර එහි ලක්ෂණ හඳුනාගෙන සටහන් කරන්න.
- 6.1 අභ්‍යාසය කරන්න.



සවිධි අෂ්ටතලය    සවිධි ද්වාදසතලය    සවිධි විංසතිතලය